## ශ්‍රී ලංකා බිලියඩ් සහ ස්නූකර් සංගමය - 2015

-----------------------------------------------------

ශ්‍රී ලංකා බිලියඩ් සහ ස්නූකර් සංගමයේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1993 අංක 47 දරන ක්‍රීඩා (සංශෝධිත) පනතේ 9 වගන්තිය සමඟ සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මෙම විගණනය ක්‍රියාත්මක කිරීමේදී , මා විසින් පරිචයෙහි යෙදෙන වරලත් ගණකාධිකාරී සමාගමක සහාය ලබා ගතිමි. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරුකිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සංගමයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සංගමයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

----------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයෙහි දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

### 2. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

----------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා බිලියඩ් සහ ස්නූකර් සංගමයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන්

වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

පහත නිරීක්ෂණ සිදු කෙරේ.

(අ) සියළුම ස්ථාවර වත්කම් සඳහා තනි ක්ෂය අනුපාතයක් භාවිතාකිරීමේ උචිතභාවය ප්‍රශ්ණකාරී වේ.

(ආ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ස්කන්ධය/ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය ඉදිරිපත් කර නොතිබුණි.

### 2.2.2 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම

-------------------------------------

මේ පිළිබඳව පහත නිරීක්ෂණ සිදු කෙරේ.

(අ) 2009 වර්ෂයේදී දේපළ පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණන කර තිබුණද, ප්‍රත්‍යාගණන වාර්තාවක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. එබැවින්, ප්‍රත්‍යාගණන ක්‍රියාවලිය හා එහි ගිණුම් තැබීමෙහි නිවැරදිතාවය සහ සම්පූර්ණ බව විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි විය.

(ආ) සංගමය විසින් ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබූ අතර, මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ස්ථාවර වත්කම්වල අයිතිය, පැවැත්ම සහ වටිනාකම තහවුරු කර ගැනීමට අදාල සහායක ලියවිල්ලක් ලෙස භෞතික සත්‍යාපන වාර්තාවක් වසර කීපයක සිට විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. එම නිසා සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති එකතුව රු.1,076,027 ක ස්ථාවර වත්කම්වල ධාරණ අගයෙහි නිවැරදිතාවය විගණනයේදී තහවුරු කරගත නොහැකි විය.

## 3. මූල්‍ය සමාලෝචනය

---------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා බිලියඩ් සහ ස්නූකර් සංගමයේ මෙහෙයුම් කටයුතුවලින් වූ මූල්‍ය ප්‍රතිඵලය රු.495,868 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 121,730 ක් වීමෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු. 617,598 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. වියදම රු. 482,505 කින් ඉහළයාමට සාපේක්ෂව ආදායම රු. 1,100,103 කින් ඉහළයාම මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 4. පද්ධති හා පාලනයන්

-------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින්වර සංගමයේ කළමනාකරණය දැනුවත් කරන ලදි. පහත පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානයක් යොමු කල යුතු වේ.

(අ) ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වා ගෙනයාම .

(ආ) අයවැය පාලනය.